# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජනවාරි 2015

## (50) මූලික ගිණුම්කරණය
(Basic Accounting)

---

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 30**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් පැහැදිලිව ප්‍රශ්න පත්‍රයේ සඳහන් කර තිබුණ ද, එම උපදෙස් පිළිබඳව සැලකිල්ල නොදැක්වූ සමහර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය තුළම පිළිතුරු සටහන් කර එය උත්තර පොතට අමුණා තිබෙනු දක්නට ලැබුණි. අයදුම්කරුවන් පොදුවේ පහත සඳහන් (A), (C), (D), (K) සහ (O) යන බහුවරණ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී දුර්වලතා පෙන්නුම් කර තිබිණි:

(A) මූල්‍ය ප්‍රකාශ කට්ටලයේ සංරචකයක් නොවන්නේ පොදු ලෙජරය වුවද සමහර අයදුම්කරුවන් එය (3) වැනි පිළිතුර වූ ස්කන්ධයේ වෙනස්වීම දැක්වෙන ප්‍රකාශය ලෙස දක්වා තිබුණි.

(C) විචක්ෂණභාවය පිළිබඳ සංකල්පය සඳහා වූ නිවැරදි උදාහරණය බෙහෝ පිරිසකට හඳුනාගැනීමට නොහැකි වී ඇති බව තෝරාගෙන තිබූ වැරදි පිළිතුරු වලින් පැහැදිලි වේ.

(D) ව්‍යාපාරයෙන් ගෙවූ ව්‍යාපාරිකයාගේ දුරකතන බිල්පත ව්‍යාපාරයේ ගැනිලි ලෙසට සැලකීමට අදාල වන සංකල්පය අංක (1) ඒකක/අස්තිත්ව (Entity) සංකල්පය වුවද අයදුම්කරුවන් වැඩි පිරිසක් අංක (2) අඛණ්ඩ පැවැත්ම සහ ගැලපුම් / සීහුම් සංකල්පය වැනි වැරදි පිළිතුරු තෝරාගෙන තිබුණි.

(K) පාලනය කළහැකි පොදුකාර්ය පිරිවැයට නිවැරදි උදාහරණය අංක (1) කම්කරු අතිකාල වුවද බොහෝ පිරිසක් අංක (4) ඉහත සඳහන් සියල්ලම යන වැරදි පිළිතුර තෝරාගෙන තිබුණි.

(O) බොහෝ පිරිසකට පොදුකාර්ය වලට අදාල නිවැරදි ප්‍රකාශය හඳුනා ගැනීමට නොහැකි වී ඇති බව දී තිබූ වැරදි පිළිතුරු වලින් පැහැදිලි වේ. නිවැරදි පිළිතුර අංක (3) වුවද බොහෝ පිරිසක් අංක (4) සහ අංක (2) නිවැරදි පිළිතුර ලෙසට සටහන් කර තිබුණි. අයදුම්කරුවන් තුල පොදුකාර්ය පිරිවැය සම්බන්ධයෙන් මනා අවබෝධයක් නොමැති බව මෙවැනි සරල ප්‍රශ්නයකට පවා නිවැරදි පිළිතුර තෝරාගැනීමට අසමත් වීම තුලින් මනාව පැහැදිලි වේ.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 25**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

දී ඇති ශේෂ පිරික්සුම සහ ගැලපිලි ආශ්‍රයෙන් ආදායම් ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය) පිළියෙල කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම අනිවාර්ය ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. ශේෂ පිරික්සුමේ සඳහන් සමහර ගැලපිලි සම්බන්ධයෙන් අයදුම්කරුවන් තුළ පොදුවේ දක්නට ලැබුණු දුර්වලතාවයන් පහත දැක්වේ:

**<u>ගැලපිලි සටහන් 01</u>**

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය මත තොග ඇගයීම කළ යුතුය. එහෙත් මෙම මූලික සිද්ධාන්තය පිළිබඳ දැනුම නොමැති සමහර අයදුම්කරුවන් වැඩි අගය වූ රු.940,000/- අවසාන තොග වටිනාකම ලෙස සටහන් කර තිබුණි. තවත් සමහරු අවසාන තොග වටිනාකමින් ගැනිලි අඩුකර තිබෙනු දක්නට ලැබුණි.

**<u>ගැලපිලි සටහන් 02</u>**

සමහර අයදුම්කරුවන්ට බොල්ණය කපා හැරීම පිළිබඳ දැනුම අඩුබව දක්නට ලැබුණි. සමහරු බොල්ණය කපා හැරීම නිවැරදිව ණයගැතියන්ගෙන් අඩුකර ශේෂ පත්‍රයේ දක්වා තිබුණද, එම කපාහල අගය ආදායම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. තවත් සමහරු කපාහල බොල්ණය වටිනාකම ශේෂ පත්‍රයේ ඇති ණයගැතියන්ට එකතුකර තිබෙනු දක්නට ලැබුණි. එමෙන්ම සමහරු කපාහල බොල්ණය වටිනාකම නිවැරදිව ආදායම් ප්‍රකාශයේ සටහන් කළ ද, එය ශේෂ පත්‍රයේ ණයගැතියන්ගෙන් අඩු කර නොතිබුණි.

**<u>ගැලපිලි සටහන් 03</u>**

අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක් සාප්පු කුලී සම්බන්ධ ගැලපීම නිවැරදිව කර නොතිබුණි. උපචිත කුලිය සැලකිල්ලට ගෙන වර්ෂයට අදාළ කුලිය නිවැරදිව ගණනය නොකිරීම, වර්ෂ දෙකටම අදාළ කුලිය ආදායම් ප්‍රකාශයේ සටහන්කර තිබීම වැනි දුර්වලතා අයදුම්කරුවන් තුළ පොදුවේ දක්නට ලැබුණි.

**<u>ගැලපිලි සටහන් 04</u>**

බොහෝ පිරිසක් රක්ෂණ ගැලපීම නිවැරදිව සටහන් කර නොතිබුණි. ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු සමහරු ශේෂ පත්‍රයේ සටහන් කර නොතිබුණු අතර මාස 9 කට අදාළ රක්ෂණ ගාස්තුව වූ රු.180,000/- ආදායම් ප්‍රකාශයේ නිවැරදිව සටහන් කර නොතිබුණි. තවත් සමහරු මාස 9 කට අදාළ රක්ෂණ ගාස්තුව පිළිබඳව සැලකිලිමත් නොවී මුළු රක්ෂණ ගාස්තුව වූ රු.240,000/- ම පරිපාලන වියදම් වලින් අඩුකර තිබුණි.

**<u>ගැලපිලි සටහන් 05</u>**

ආරම්භක තොග වටිනාකමට ගැණුම් එකතුකළ පසු එන අගයෙන් භාණ්ඩ ගැනිලි වල වටිනාකම අඩු කළ යුතු වුවද, සමහරු එම ගැනිලි අවසාන තොග වටිනාකමින් අඩුකර තිබෙනු දක්නට ලැබුණි.

**<u>ගැලපිලි සටහන් 06</u>**

බෙහෝ පිරිසක් ක්ෂය ගණනය කිරීම් නිවැරදිව කර තිබුණද, සමුච්ජිත ක්ෂය නිවැරදිව සටහන් කර නොතිබෙනු දක්නට ලැබුණි.

**<u>ගැලපිලි සටහන් 07</u>**

උපචිත දුරකතන සහ විදුලිය ගාස්තු නිවැරදිව ආදායම් ප්‍රකාශයේ ගලපා තිබුණද බොහොමයක් අයදුම්කරුවන් එම උපචිත වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ නිවැරදිව සටහන් කර නොතිබුණි.

**<u>ගැලපිලි සටහන් 08</u>**

බැංකු ණය ඊළඟ වර්ෂය තුළදී එනම් කෙටිකාලයක් තුළදී ගෙවා නිමකළ යුතු හෙයින් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ පෙන්නුම් කළ යුතුවිය. එහෙත් සමහරු එය ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 25**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය A සහ B වශයෙන් කොටස් දෙකකින් සමන්විත වූ අනිවාර්ය ප්‍රශ්නයකි.

A කොටස

විධිමත්ව පොත්පත් පවත්වාගෙන නොයන කේවලස්වාමි ව්‍යාපාරයක, දී ඇති තොරතුරු ආශ්‍රයෙන් ශේෂ පිරික්සුම පිළියෙල කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම සහ අවබෝධය මැන බැලීම සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත.

මෙහිදී ගනුදෙනුකරුවන්ගෙන් (ණයගැතියන්ගෙන්) ලැබිය යුතු සහ ගනුදෙනුකරුවන්ට (ණයහිමියන්ට) ගෙවිය යුතු ගිණුම් ආශ්‍රයෙන් විකුණුම් සහ ගැනුම්වල වටිනාකම් සොයාගත යුතු අතර තත්ත්ව විස්තරය පිළියෙල කිරීම තුලින් ආරම්භක ප්‍රාග්ධනය සොයාගත යුතු විය. සමහරු එවැනි ගිණුම් සහ ප්‍රකාශ පිළියෙල නොකිරීම නිසා වැරදි අගයක් ශේෂ පිරික්සුම තුල සටහන් කර තිබුණි. පෙරවැඩ සටහන් කර තිබුනානම් නිවැරදි සටහන් මත ලකුණු කිපයක් හෝ ලබා ගැනීමට ඉඩ තිබුණ ද එසේ පෙරවැඩ නොපෙන්වීම නිසා එම ලකුණු පවා අහිමි විය.

මොටර් වාහන ක්ෂය ගැලපීම නිවැරදිව ගණනය කර තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකි. සමහරු දී ඇති උපදෙස් සැලකිල්ලට නොගෙන සහ ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර ගැනීමෙන් තොරව ශේෂ පිරික්සුම වෙනුවට ශේෂ පත්‍රය පිළියෙල කර තිබුණි.

B කොටස

මෙම කොටස (a) සහ (b) වශයෙන් අනු කොටස් දෙකකින් සමන්විතය. (a) කොටසින් වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් පිළියෙල කිරීම පිළිබඳවද (b) කොටසින් ගලපන ලද ලාභය / අලාභය ගණනය කිරීම පිළිබඳ දැනුමද පරීක්ෂාවට ලක්කර තිබුණි.

බොහෝ පිරිසක් ජර්නල් සටහන් අංක 2 එනම් කාර්යාල උපකරණ ක්ෂය කිරීමට අදාල සටහන් නිවැරදිව පිළියෙල කර නොතිබුණි. කාර්යාල උපකරණ සඳහා මාස 6 කට පමණක් ක්ෂය වාර්තා කළ යුතු වුවද වැඩි පිරිසක් මුළු වර්ෂයටම ගණනය කර තිබෙනු දක්නට ලැබුණි. තවත් සමහරු ජර්නල් සටහන් වල "හර" සහ "බැර" පැති මාරු කර සටහන් කර තිබුණි. ගලපන ලද ලාභය නිවැරදිව ගණනය කර තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් සුළු පිරිසකි. සමහරු ගලපන ලද ලාභය සෙවීමේදී එකතුකළ යුතු අගයන් අඩුකිරීම් ලෙසටද, අඩුකළ යුතු අගයන් එකතු කිරීම් ලෙසටද සටහන් කර තිබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

මෙම තෝරාගත හැකි ප්‍රශ්නය A සහ B වශයෙන් කොටස් දෙකකින් සමන්විත වූ අතර A කොටසින් ණයගැති පාලන ගිණුම් සහ ණයගැති ලෙජර් ගිණුම් නිවැරදි කිරීම සම්බන්ධ දැනුම සහ අවබෝධය ද B කොටසින් ශ්‍රම නිමැවුම් වාර්තා පිළිබඳ දැනුම ද පරීක්ෂාවට ලක්කර ඇත. පිළිතුරු සැපයූවන්ගෙන් වැඩි පිරිසකගේම ණයගැති පාලන ගිණුම් සහ ණයගැති ලෙජර් ගිණුම් නිවැරදි කිරීම පිළිබඳ දැනුම ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි. ණයගැති පාලන ගිණුම් පිළිබඳ නිසි අවබෝධයක් නොමැති කමින් ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට අදාලව ප්‍රශ්න පත්‍රයේ ඇතුලත් කරුණු හතරම පාලන ගිණුමට ඇතුලත් කර තිබෙනු දක්නට ලැබුණි.

B කොටසෙහි ඇතුලත් ශ්‍රම නිමැවුම් වාර්තා පිළිබඳ බොහෝ පිරිසකට පැහැදිලි අවබෝධයක් නොමැති බව දක්නට ලැබුණි. නිවැරදිව උදාහරණයක් දැක්වීමට බොහෝ පිරිසක් අපොහොසත් වී තිබූ අතර ශ්‍රම නිමැවුම් වාර්තා පවත්වා ගැනීමේ වාසි නිවැරදිව සටහන් කිරීමටද ඔවුන් අපොහොසත් වී ඇත.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

තෝරාගත හැකි මෙම ප්‍රශ්නය ද A සහ B වශයෙන් කොටස් දෙකකින් සමන්විත විය. A කොටසින් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය මත ගබඩා ලෙජරය පවත්වාගෙන යාම සහ තොග ගණනය කිරීමද, B කොටසින් ද්‍රව්‍ය පාලනය පිළිබඳ දැනුමද පරීක්ෂාවට ලක්කර ඇත. ගබඩා ලෙජරයේ ආකෘතිය පිළිබඳ සමහරුනට කිසිදු අවබෝධයක් නොමැති බව දක්නට ලැබුණි.

B කොටසට අදාලව දී ඇති පිළිතුරු වලින් පැහැදිලි වන්නේ බොහෝ පිරිසකට ද්‍රව්‍ය පාලනය පිළිබඳ දැනුමක් නොමැති බවය. ද්‍රව්‍ය පාලනයේ අරමුණු පැහැදිලිව සටහන් කර තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් සුළු පිරිසකි.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

තෝරාගත හැකි මෙම ප්‍රශ්නයද A සහ B වශයෙන් කොටස් දෙකකින් සමන්විත විය. A කොටසින් ගිණුම්කරණ සමීකරණ පිළිබඳවද B කොටසින් ඍජු සහ වක්‍ර පිරිවැය පිළබඳ අවබෝධයද පරීක්ෂාවට ලක්කර ඇත. ගිණුම්කරණ සමීකරණය ප්‍රශ්න පත්‍රය තුල පැහැදිලිව සටහන් කර තිබුණද සමහරු එය සැළකිල්ලට නොගෙන වැරදි පිළිතුරු සටහන් කර තිබුණි.

ඍජු සහ වක්‍ර පිරිවැය පිළිබඳ අවබෝධයක් නොමැති සමහරුනට එය පැහැදිලි කිරීමට නොහැකි වී ඇති අතර පැහැදිලි උදාහරණ ඉදිරිපත් කිරීමට ද නොහැකි වී ඇත.

- * * * -